# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2462/37 – 2025 නොවැම්බර් මස 14 වැනි සිකුරාදා – 2025.11.14**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය - IR/COM/02/2024/102

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2025.04.04 දිනැති හා අංක 2430/38 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2025.03.25 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් අළුත්ගම, වැලිපැන්න පාර,අංක 341/1 හි පදිංචි ඩබ්. ඩී. සුසිල් ප්‍රේමරත්න මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන්, කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, අංක 34 හි පිහිටි ජාතික නිවාස සංවර්ධන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A17/2025 හා 2025.10.08 දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**  
කම්කරු කොමසාරිස් ජනරාල්

2025 ඔක්තෝබර් මස 30 වැනි දින,  
කම්කරු දෙපාර්තමේන්තුව,  
කොළඹ 05.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කොළඹ බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේදීය.

යොමු අංකය: IR/COM/02/2024/102
නඩු අංකය: A/17/2025

1. ඩබ්. ඩී. සුසිල් ප්‍රේමරත්න මයා,
   අංක 341/1,
   වැලිපැන්න පාර,
   අළුත්ගම.

*පළමු පාර්ශ්වය*

සහ

2. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය,
   අංක 34,
   ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
   කොළඹ 02.

*දෙවන පාර්ශ්වය*

**ප්‍රදානය**

ඉහත පාර්ශ්වයන් අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ගරු කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරුවෙකු වශයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවතින කරුණ වනුයේ;

" ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවයේ නියුතු ඩබ්. ඩී. සුසිල් ප්‍රේමරත්න මහතාට 2012.03.19 දින සිට JM- 1-1-1 වැටුප් තලයට අදාල පරිපාලන නිලධාරී තනතුර සඳහා හිමිකමක් පවතිද යන්න හා 2012.03.19 දින සිට එකී තනතුර සඳහා හිමිකමක් පවතී නම් ඔහුට හිමි විය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ."

**ප්‍රදානය**

මෙහි පළමු පාර්ශ්වය වන ඩබ්. ඩී. සුසිල් ප්‍රේමරත්න මහතා හට මෙම බේරුම්කරණ ආරාවුල සඳහා ඉදිරියේදී සහභාගී වීමට හැකියාවක් නොමැති බව දන්වා, මෙම ආරාවුල අවසන් කර දෙන ලෙස ඉල්ලමින් 2025.09.25 දිනැති ලිපිය මඟින් පැමිණිලිකරු විසින් බේරුම්කරණ අංශය වෙත ලිඛිතව දන්වා ඇත.

එබැවින් පළමු පාර්ශ්වය මෙම ආරාවුල ඉල්ලා අස්කර ගැනීම හේතුවෙන් නඩු කටයුතු අවසන් කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව තීරණය කරමි.

**කේ. ඒ. එස්. කීරගල,**
බේරුම්කරු.

2025 ඔක්තෝම්බර් මස 08 වැනි දින,
බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේදීය,

EOG 11-0108

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.